ih, yulu wejrK
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01 මහා මායා දේවියගේ මව්පියන් ජීවත් වූයේ (රජගහ නුවරයි. / දෙව්දහ නුවරයි.)

02 සිදුහත් කුමරා තම පිය රජුගෙන් දෙවන වර වැඳුම් ලැබුවේ අහසේ පලක් බැඳ (මෛත්‍රී භාවනාව කළ අවස්ථාවේ / ආනාපානසති භාවනාව කළ අවස්ථාවේ)

03 සිදුහත් තාපසතුමාට සිවුරු පිරිකර පූජා කළේ (සහම්පති බ්‍රහ්මයාය / ඝටීකාර බ්‍රහ්මයාය)

04 ''ඉමිනා පුඤ්ඤකම්මේන - මාමේ බාලසමාගමෝ'' මෙම ගාථාව (ප්‍රාර්ථනා ගාථාවයි / බුද්ධරත්නය කමාකරවා ගැනීමේ ගාථාවයි)

05 සියලු සතුන් කෙරෙහි මිතුරු සිතින්, හිතවත්ව ක්‍රියා කිරීම (කරුණාවයි / මෛත්‍රියයි)

06 ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුරට පත්වූයේ (නන්ද තෙරුන් වහන්සේය / රාහුල තෙරුන් වහන්සේය)

07 පුද්ගලයකුගේ දියුණුව සඳහා උපකාරී වන කරුණු හයක් පෙන්වා දී ඇති ජාතක කතාව (ස්වර්ණ හංස ජාතකයයි. / අත්තස්සද්වාර ජාතකයයි.)

08 වචනයෙන් සිදුවන අකුසල් ගණන (හතරකි. / පහකි.)

09 සීලය දෙයාකාර වේ. එනම් චාරිත්‍ර, වාරිත්‍ර යන්නයි. ඉන් චාරිත්‍ර යනු (විරතියයි. / සමාදානයයි.)

10 දෙමාපියන්ට දරුවන් උපස්ථාන කළ යුතු ආකාර දක්වෙන සූත්‍රය වන්නේ, (මංගල සූත්‍රයයි. / සිඟාලෝවාද සූත්‍රයයි.)

- **පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 මඝ මානවක නිවැරදි ක්‍රියා කළ ප්‍රියමනාප සමාජශීලී තරුණයෙකි. ( )

12 මෙරට ජීවත්වන සැවොම ශ්‍රී ලාංකිකයෝ වෙති. ( )

13 ජාතික කොඩිය ඔසවන අවස්ථාවලදී සියලු දෙනාම වාඩිවී සිටිය යුතුය. ( )

14 ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය බෝගසයි. ( )

15 ජාතික සංකේත රටක අනන්‍යතාව පිළිබිඹු කරයි. ( )

16 බුදුන්වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය දේශනා කළේ සුද්දෝධන රජතුමාටය.( )

17 පසුව පසුතැවිලිවන ක්‍රියා කළ යුතුය. ( )

18 සිදුහත්කුමරා ගිහි ජීවිතය පිළිබඳ මහත්සේ කළකිරුනේ සතර පෙරනිමිති දැකීමෙනි. ( )

19 පරම්පරාව රැකගැනීම දෙමාපියන්ගේ යුතුකමකි. ( )

20 ලොව පවතින පණ ඇති පණ නැති හැම දෙයක්ම වෙනස්වීමට යටත් වේ. ( )

(2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) බුද්ධ කෝලාහලය යනු කුමක් ද?

(2) සිදුහත් බෝසතාණන් මව්කුස පිළිසිඳගත්තේ කවදාද?

(3) ''රජතුමනි, මේ කුමරු ඒකාන්තයෙන්ම බුදුවෙනවා.'' මෙසේ ප්‍රකාශ කළේ කවුද?

(4) සිදුහත් කුමරු ශිල්ප උගත්තේ කාගෙන්ද?

(5) යසෝදරා දේවියගේ පියා කවුද?

(6) ''බුදු බව ලබා පළමුවෙන්ම මගේ රාජ්‍යයට වඩින්න.'' සිදුහත් බෝසතාණන්ගෙන් මෙම ඉල්ලීම කළේ කවුද?

(7) පාරිභෝගික චෛත්‍යය යනු කුමක් ද?

(8) භාවනා කිරීමේ දී ශිෂ්‍යයකු හිඳගත යුත්තේ කෙසේද?

(9) ''මේ වැලි දෝතේ වැලිකැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවා.'' මෙසේ ප්‍රාර්ථනා කළේ කවුද?

(10) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය කුමක් ද?

02 (1) ජාතික කොඩියේ අඩංගු සංකේත දෙකක් නම් කරන්න.

(2) ඔබ නම් කළ සංකේතයක් පැහැදිලි කරන්න.

(3) ජාතික කොඩියට ගරු කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න.

03 (1) ''වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්'' මෙම කවිය සම්පූර්ණ කරන්න.

(2) දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.

(3) දෙමාපියන්ගෙන් දරුවන්ට සැලසෙන යහපත පැහැදිලි කරන්න.

04 (1) ''පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' මෙම ශික්ෂා පදයට අදාළ පෙළ පොතේ සඳහන් කවිය ලියන්න.

(2) ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලය නම් කරන්න.

(3) විරමනය හා සමාදානය එක් සිල්පදයක් ඇසුරින් පැහැදිලි කරන්න.

05 (1) සීල ශික්ෂාවට අයත් මාර්ගාංග දෙකක් නම් කරන්න.

(2) සම්මා කම්මන්තයට අයත් අංග තුන දක්වන්න.

(3) සම්මා වාචා පැහැදිලි කරන්න.

06 (1) මෛත්‍රිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(2) මෛත්‍රී භාවනාව කිරීමෙහි පළමු පියවර දක්වන්න.

(3) මෛත්‍රී භාවනාවේ ආනිසංස පහක් ලියන්න.

07 (1) බුදු ගුණ සිහිකරන පාඨය ලියන්න.

(2) ඔබ පන්සලට ගිය විට කරන වතාවත් තුනක් ලියන්න.

(3) විහාරස්ථානයක දී වන්දනාමාන කරන අනුපිළිවෙල ලියන්න.